# ගොවිජන සංවර්ධන අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ඉසින යන්ත්‍ර හා බුල්ඩෝසර් සේවා සඳහා ලැබුණු සේවා ගාස්තු රු. 10,746,805 ක් ආදායමට නොගෙන ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.10,746,805 කින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ මුදල් ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීමේදී රු. 651,797ක වෙනසක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටම පැවතුනත් එය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිවැරදි කර නොතිබුණි.

(ආ) අයිතමයන් 03 ක මූල්‍ය ප්‍රකාශනවල හා උප ලේඛනවල දක්වා තිබූ අගයන් අතර, රු.93,042 ක වෙනසක් පැවතුණි.

#### 1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "ජපන් යෙන්" ආධාර වැඩසටහන යටතේ ගොවි කමිටු හා ගොවි සමිති වෙත බෙදාදී තිබුණු කෘෂි උපකරණ සඳහා වාරික වශයෙන් අයකරගන්නා මුදල ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමකට බැර කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යැවිය යුතු වුවත්,

රු.259,438,586 ක්වූ වාරික මුදල් 2012 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලේ තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

තවද, මෙම වැඩසටහන යටතේ එක් එක් වර්ෂවල බෙදා දුන් ට්‍රැක්ටර් සඳහා වාරික අයකර ගැනීම ඉතා මන්දගාමී තත්ත්වයක පැවති අතර, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වාරික මුදල රු.340,200,616 ක් විය.

(ආ) 1995 සහ 1996 වර්ෂවලදී අරමුදල විසින් බෙදා දෙන ලද රෝද දෙකේ ට්‍රැක්ටර් ට්‍රේලර් සහ රෝද හතරේ ට්‍රේලර් සඳහා 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වාරික මුදල පිළිවෙලින් රු.1,498,566 ක් සහ රු.4,749,500 ක් වී තිබුණි.

(ඇ) 2001 වර්ෂයේ සිට තොග ඌනතාවය ලෙස හඳුනාගෙන තිබුණු රු.450,000 ක් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ලැබිය යුතු ගිණුම්වල වර්ෂ 6 කට වඩා වැඩි කාලයක සිට පවතින රු.6,445,758 ක ණය ශේෂයක් අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මකකර නොතිබුණි.

**1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පිඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(3)(ඇ) ඡේදය | සමුච්චිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශනය වෙනම ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | මු.රෙ. 371 (5) | අරමුදල විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.767,332 ක් වටිනා අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,492,719 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,690,383 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.6,183,102 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

සමාලෝචිත වර්ෂයේ වියදම රු.6,476,960 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා ජපන් ආධාර ව්‍යාපෘතිය විසින් දිස්ත්‍රික්ක 09 ක ගොවිජන මධ්‍යස්ථාන 12 කට ලබාදී තිබූ රු.1,646,803 ක්වූ ට්‍රැක්ටර් සඳහා එකම වාරිකයක් හෝ අයකර නොතිබුණු අතර, එම වාරික මුදල් කාර්යක්ෂමව අයකර ගැනීමේ වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්ක 14 ක් සඳහා 2010 වර්ෂයේ බෙදාහරින ලද වටිනාකම රු.1,700,000 ක්වූ වතුර පොම්ප සඳහා 2012 දෙසැම්බර් 31 දිනට වාරික අයවීමේ ප්‍රතිශතය සියයට 46 ක් වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික්ක 11 ක් සඳහා ලබාදී තිබූ වටිනාකම රු.37,785,110 ක්වූ ට්‍රැක්ටර් ණයවලින් 2012 දෙසැම්බර් 31 දිනට රු.19,533,639 ක වාරික හිඟහිටව පැවතුණි. මෙම හිඟහිටි මුදල ලබාදී තිබුණු මුළු ණය ප්‍රමාණයෙන් සියයට 51 ක් වී තිබුණි.

(ඈ) රෝද දෙකේ ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා ලබාදුන් ණය දිස්ත්‍රික්ක 02 ක සම්පූර්ණයෙන්ම හිඟව පැවති අතර, දිස්ත්‍රික්ක 15 ක සමස්ත අයවීම් සියයට 10 ක පමණ අවම මට්ටමක පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ අයවැය ලේඛනයේ සංවර්ධන කාර්යයන් 07 ක් සඳහා සලසා තිබුණු රු.47,650,000 ක මුළු ප්‍රතිපාදනය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අක්කර බදු අයකර ගැනීම
(ආ) තැන්පතු ගිණුම් නිරවුල් කිරිම
(ඇ) ණය අයකර ගැනීම
(ඈ) වත්කම් උපයෝජනය
(ඉ) අත්තිකාරම් ලබාදීම